# මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

# දෛනික පදනම මත වැටුප් ගෙවීමට යටත්ව රියදුරන් දෙදෙනකු සේවයේ යොදවා ගැනීම

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු 02ක් සඳහා දෛනික පදනම මත වැටුප් ගෙවීමට යටත්ව මාස 06ක කාලයක් සේවයේ යොදවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**මූලික සුදුසුකම් :-**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (සේවා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම පිණිස ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටකදී පමණක් මධ්‍යම පළාත් සභාව තුළ පිහිටි යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ අයදුම්පත් සලකා ලබනු ලැබේ.)

iii. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර අවුරුදු 45ට අඩු විය යුතුය.

iv. මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

v. අවම උස අඩි 05 අඟල් 02,1/2ක් විය යුතුය.

vi. මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමකින් යුක්ත විය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම් :-**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.

**වෘත්තීය සුදුසුකම් :-**

I. පෞද්ගලික/ කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළබඳව සහතිකයක් ලබා තිබීම. (සේවයේ යොදවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම)

II. ලොරි රථ හා ට්‍රැක්ටර් රථ රියදුරු ලෙස සේවයේ යෙදවීමට අදාළ වෘත්තීය සුදුසුකම්වන තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (සේවයේ යොදවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03 කට පෙර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද "ඒ"වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බල පත්‍රයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.)

**පළපුරුද්ද :-**

I. මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

❖ සේවයේ යොදවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

**අයදුම් කළ යුතු ආකාරය :-**

ඔබගේ ජීව දත්ත ඇතුලත්ව සකස් කරන ලද අයදුම්පත්‍ර 2025.06.16 දිනට ප්‍රථම "ලේකම්, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, අම්පිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "දෛනික පදනම මත වැටුප් ගෙවීමට යටත්ව රියදුරන් සේවයේ යොදවා ගැනීම සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

**දුරකථන අංකය :- 081 – 2241222**

**ලේකම්,**
**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, අම්පිටිය.**